සංක්‍රමණිකයකුගේ සටහන

සුදෝ සුදු ආදරේ

සංගීතය යනු හඬකට කිසියම් රිද්මයක් ලබාදීමයි. මේ රිද්මය තුළින් ගොඩනැගෙන හඬ සංගීතය මිනිසුන්ගේ සිතුම් පැතුම් චාර්යාවන් කෙරෙහි හොඳ හෝ නරක ලෙස දැඩි බලපෑමක් ඇති කරන්න පුළුවන්. අවුරුදු දහස් ගණනක් තිස්සේ මනුෂ්‍ය වර්ගයා පිනවූ මේ සංගීතය 19 වැනි සියවසෙහි අගභාගය වනවිට විශාලවීම් පනිමින් බටහිර සංගීතය පොප් - ජෑස් - රේගේ හරහාද හින්දුස්ථානි සංගීතය ඔස්සේ පැමිණි දේශීය සංගීතය ජන ආර හා මුසුවෙමින් පැමිණි අද වනවිට මේ දේශීය හා බටහිර සංගීත සංකලනය මිනිසුනට තේරුම් ගත නොහැකි විපරීත සංගීතයක් බවට පත්වී තිබේ. එදා ගීතයක් ශ්‍රවනය කිරීමෙන් මිනිසුන් හතවදාට ලැබූ ආනන්දය වෙනුවට Fun එකක් ප්‍රශ්දාව - තෘප්තිය වෙනුවට kick ලබන තරමට සංගීත රස විඳීමත් වෙනස් වෙලා නැතහොත් වෙනස් කරලා.

ඒත් මේ Fun - kick සංගීතයට පැවැත්මක් නැති බව අපි හැමෝම අද්දුටු දෙයක්. මේක මියයන සංගීතයක් බව දැන දැනත් අපේ නව පරපුර ඉන් මිදෙන්න උත්සාහ නොගන්නේ ඇයි කියලා හිතුනේ පසුගිය දවසක අපේ සුපර්ස්ටාර් මල්ලිගේ ගීත කීපයක් ඇහුනට පස්සේයි. සමාජය වේගවත් ගමනක යනකොට සමාධි ගත රස විඳීමකට කාලයක් නැති නිසා ක්ෂණික දේ සපයිය යුතු බවත්, ඔහු කියනවා ඇහුනා සංවාදයකදී. ඇත්ත තමයි ඒත් අපේ රචකයෝ අගයපු, සුරම්‍ය, අච්ඡන්ත, පරම රමණීය, පිවිතුරු අවල ආදරේ 'විමි' වගේ සුදෝ සුදු ආදරයක් තරමට සරල කරන එක සාධාරණද?

සරල වෙන එකේත් ක්‍රමයක් තියෙනවා. මල්ලි ඇතුලු කට්ටිය ගැන දුකයි. හුගදෙනෙකුට නොගැලපෙන නොලැබුනු අවස්ථාවක් ඔයාලට ලැබුණා. ඒක ඉක්මන් කෙටි ගමනක් සඳහා නොව, දිගු ස්ථාවර ගමනකට අඩිතාලම කර ගන්න බවක් පෙන්න නැහැ. ගීතයකින් ලැබිය යුතු තෘප්තිය වෙනුවට කුණු රසය මේ දවස්වල පෙරට ඇවිත් තමයි. ඒත් මිනිස්සු තුළ තවමත් රසවිඳීමේ ශක්තිය නැතිවෙලාම නැහැ. ඒක අපි මෙහිදී අත්දැකල තියෙනවා. වෙළෙඳපොලේ මාකට් වෙන්න හැකියාව විතරක්ම මදි. ඒකට ක්‍රමයක් සහ වෙලාවක් තියෙනවා. ඕකට මිනිස්සු ලැබීමත් කියනවනේ. අවසාන වශයෙන් කියන්නේ මල්ලිලා අඩුම ගණනේ හරි ගමනකට මුල පුරලවත් හිටිය නම්, ඔයගොල්ලො මෙහෙ ගෙන්වන්න වෙහෙස උත උදැවියට ඒ වගේ තත්ත්වයකට මුහුණපාන්න මෙහේ රසිකයෝ ඉඩ නොදෙන්න තිබුණා.

අදහන්නට නොව අනුගමනට කරන්නට වේ

සටන් කරුවා නුඹ ය
සටන අත් හැර නොගිය
මරණයෙන් නොනැවතුණ

නුඹ හෙලූ රුධිරය
නොදන්නා සුවහසක් මිනිසුන්ගේ

වේ

විමුක්තිය වෙනුවෙන්
පිපුණි රතු මල් විලස
නොදන්නා බිම් කඩක

දශක සතරක් පුරා
පර නොවූ එමල් මත
රැඳෙයි කඳුළක් නිබඳ
නුඹට තව පෙම් කරන
නැලෙන මිනිසුන් හෙළණ

නුඹට මම නිස නමමි
සටන් කරුවා නුඹය
සටන අත් හැර නොගිය
මරණයෙන් නොනැවතුණ

ළමා දිනය

ලෝක ළමා දිනය 1 වැනිදා ගෙවී ගියා. ''මිනිසුන්ගේ ඉහළම වස්තුව දරුවන්'' යැයි වදාලේ බුදුන් වහන්සේ යි. ''ළමයකුගේ වර්ධනයට මුළු ගමක්ම වගකිව යුතුයි'' යන්න ප්‍රකට අප්‍රිකානු කියමනක්. සැබෑ ලෙසම ළමයින්ගේ වර්ධනයට හොඳම පරිසරය ගොඩ නැගෙන්නේ ''පවුල'' තුළින්. ළමයින්ගේ අනාගතය වෙනුවෙන් අපූ කැප වන දෙමව්පියන්ගේ ආකල්පව, වෙනස් වන සමාජ - ආර්ථික ප්‍රශ්න හමුවේ උඩු යටිකුරු වීමෙන් විසිරි යන පවුල තුළ අනාථ වන ළමා පරපුර වෙනුවෙන් නම් කර ඇති දිනය ළමා නිවාසයකට හෝ අනාථ නිවාසයකට ඇඳුම් පැළඳුම්, පොත්පත්, පෑන් පැන්සල්දීම හෝ ඒ වෙනුවෙන් සම්මන්ත්‍රණ පැවැත්වෙන දිනයක් බවට පත්වීම කරුමය-ක්. ජනමාධ්‍ය, පරිවාස හා ළමා ආරක්ෂක දෙපාර්තමේන්තුව විදි දරුවන් ගැනත්, එක්සත් ජාතීන්ගේ ළමා ආරක්ෂක අංශය යුද්ධයේ ගොදුරු බවට පත්වී ඇති දරුවන් ගැනත් කථා කිරීම හැර වෙනත් ප්‍රායෝගික කතිකාවක හෝ වැඩපිළිවෙලක් නැතිවීම කෙතරම් අභාග්‍ය සම්පන්නද? ළමා කාලය යනු ජීවිතයේ කුමන අවස්ථාවකදීවත් යළි ලබා ගත නොහැකි කාල පරිච්ඡේදයකි. එහිදී අත්විඳින්නට ලැබෙනුයේ එම කාලයට පමණක් සීමා වී ඇති දේවල්ය. ළමා ප්‍රශ්න සපුරා විසඳීම කෙසේ වෙතත්, වගකීමක් ඇති රජයක් සමාජයක් ලෙස ළමයින්ගේ ප්‍රශ්න දෙස ඔක්තෝබර් පළමු වැනිදාට පමණක් අවධානය යොමු කිරීමේ ක්‍රියාපිළිවෙතවත් වෙනස් කිරීමට උත්සාහ කරනවා නම්, කොතරම් අගේද?

ආප්ප - පින් සහ යුතුකම

ශ්‍රී ලංකාවේ විශ්ව පරිගණක පුහුණු මධ්‍යස්ථානවලට ආධාර පිණිස පවත්වන කොත්තු ආප්ප රාත්‍රිය සෙසු ආප්ප රාත්‍රීන් හා වෙනස් වන්නේ කෙසේද කියා විමසීම අපේ යුතුකමක්. ආප්ප රාත්‍රියක් කියන කොට ක්ෂණිකව අපට දැනෙන්නේ ඒ හා සම්බන්ධ පුන්‍ය කටයුත්තක් සඳහා ආධාර ලබා ගැනීමක්. අපි පුරුදු වෙලා ඉන්නේ තෘප්තියකුත් ලබලා පිනකුත් කර ගන්න. අපි පින් දහම් කරන්නේ බොහොම වේලාවට එලොව සුව පිණිසනේ. ඒත් මේ ආප්ප රාත්‍රිය ඊට වෙනස් වෙන්නේ එය සැබෑ ලෙසම මෙලොව වැඩ පිණිස අරමුණු කොට ගත්තත් විම නිසයි. මිනිසුන්ගේ ජීවිතයේ බොහෝවිට අතපසු වෙන දේවල් තමයි යුතුකම් හා වගකීම්. අපේ රටේදී නම් ඒක තදින සිදුවුනු දෙයක්. සමාජයක් ගොඩ නැගීමට, ඉදිරියට යාමට වඩාත් වැදගත් සාධකයක් තමයි තමන් විසින් සමාජය උදෙසා කළයුතු වගකීම්. දැන් ඔබේ රටේදී ඒ අතපසු වූ යුතුකම් ඉටුකිරීම සඳහා ප්‍රමාණවත් දායකත්වයක් සපයීමට මේ ආප්ප රාත්‍රියේදී ඔබට ඉඩක් ලැබී තිබෙනවා. ''විශ්ව පරිගණක පුහුණු ආයතනය'' යනු කිසිදු මුදල් ලාබ ලැබීමේ චේතනාවකින් තොර, සම්පූර්ණයෙන්ම නොමිලේ දැනුම පුහුණුව ලබාදෙන, සමාජයේ ඉදිරි ගමන සඳහා යහපත් දියුණු මනසකින් යුත් පුරවැසියන් ගොඩ නැගීම ප්‍රධාන අරමුණ කොටගත් ආයතනයක්. පාඩමාලා සඳහා දස දහස් ගණනින් මුදල් වියදම් කිරීමට නොහැකි වරප්‍රසාද අහිමි අපේ පංතියේ දූ දරුවන්ට නව සහශ්‍රයට දොර කවුළු විවර කරදෙන මෙම ආයතනවල පාඩමාලා මෙහෙය වනු ලබන්න් විශ්වවිද්‍යාල මට්ටමේ ආචාර්ය මණ්ඩලයක් විසිනි. ඒ සියලු කටයුතු සිදු කෙරෙනුයේද සම්පූර්ණයෙන්ම නොමිලයේය. තොරතුරු තාක්ෂණ දැනුම අත්පත් කර ගැනීමට නොහැකිව ලතවෙමින් සිටින සිංහල දෙමල මුස්ලිම් ආදී සියළු ජාතිකත්වයන්ට අයත් දූ දරුවන් උදෙසා කෙරෙන මේ මහඟු කාර්යයට සුළු වශයෙන් හෝ දායකවීම ඔබේ සැබෑ යුතුකමක් නොවන්නේද?

සියළුම වරප්‍රසාදයන් විඳිමින් රටත් ජනතාවත් උගසට තබමින් තමන්ගේ වාසිය තර කර ගැනීමට පමණක් හිතන දේශපාළුවන් රජයන රටක තමන්ගේ සහෝදර ජනතාවගේ දූ දරුවන්ගේ අනාගත අභිවෘද්ධිය උදෙසා තමන්ගේ වැටුප් පරිත්‍යාග කොට මේ විශ්ව පරිගණක පුහුණු මධ්‍යස්ථානය හොඩනැගීමට දායක වූ ජනතා විමුක්ති පෙරමුණේ සියළුම පළාත් සභා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට අපගේ ගෞරවයද මේ අවස්ථාවේ පිරිනැමිය යුතුය.

ත්‍රිවිධ සමඟ විනිවිද

ඉතිහාසයේ කෙදිනකවත් නොවූ පරිදි මිනිස් පිවිතය සැහැල්ලු වෙමින් පවතී. කලාකරුවන් ද ඊට ගොදුරුවීම අරුමයක් නොවේ. ඒ අනුව සියලුම කලාවන්ද අර්බුදයකට ලක්වෙමින් තිබේ. නාට්‍යකරුවන් ද සිවිල් සමාජයේ සාමාන්‍ය සාමාජිකයෙකු නිසා සියලුදෙනාම විඳින පීඩාවට ඔහුද ගොදුරු වේ. නාට්‍යකරුවන් ඇතුලු සියලු කලාකරුවන්ට පිවත්වීම උදෙසා රජයක් මගින් හෝ වෙනත් ආයතනයක් මගින් ආධාරයක්, අනුග්‍රහයක් නොලැබෙන කල ඔවුන් ලක්වෙන ඉරණම කුමක්ද? කලාවේ පැවැත්ම උදෙසා කලාකරුවන් පිවත් විය යුතුය. ප්‍රවීණ යැයි සැලකෙන බොහෝ කලාකරුවන් තමන්ගේ නිර්මාණ දැක්ම පසුපස සහෝ දර ප්‍රේක්ෂක පිරිසක් ඇති බවද අමතක කර දමා තමන් අවට ඇති සමාජය විනිවිද දකිමින්, ඔවුන් අඳුරේ සිට ආලෝකය කරා මෙහෙයවීමෙන් කර ඇර සිටිති. එහි සරළ අරුත නම් ඔවුන්ද පිවත්වීමේ සටනට මුහුණ පා ඇති බව නොවේද? ඒ සටන තුළ ඔවුන් බොහෝ දෙනෙකුට තෝරා ගන්නට බල කෙරී ඇත්තේ ජනතාව ආනන්දයෙන් ප්‍රශ්දාව කර ගෙනයාමේ වගකීම නොව, සරළ ක්ෂණික හා හාස්‍යයෙන් ජනතාව අන්දවා වාසි තර කර ගැනීමේ මාර්ගයයි. ශ්‍රී ලංකාවි නාට්‍ය ඉතිහාසය දෙස විමසිල්ලෙන් බලන අපට දැකිය හැකි දිගු කතාන්දරයේ කෙටි සාරාංශය එයයි. ඒ අනුව අප දැන් ආකෘතිය හෝ අන්තර් ගතය ගැන නොසිතා ප්‍රේක්ෂකයින් බඩවැල් අඹරවා ගෙන සිනාසෙන නාට්‍ය නිපදවමින් සිටින්නෙමු. දැන් අපි හාස්‍යයේ උළුපත් වී සිටින්නෙමු. නාට්‍යකරුවෝ රටේ ජනතාවටද විධායක හා ව්‍යවසායදායක ලෝකයටම විහිලු සපයන පැක්ටේරි බවට පත්වෙමින් සිටිති. ඒ අනුව හාස්‍යය යනු ප්‍රශ්දාවේ එක් කොණාක්ය, යන්න මුළින පාඩයක් පමණක් බවට පත්කර ඇත්තෙමු.

ගාමිණී රූපසිංහ සොයුරාගේ ත්‍රිවිධ හාස්‍ය නාටකය නරබීමට අප යන්නේ මෙවන් මානසිකත්වයක සිටය. අප ගාමිණීගේ මේ කඳුළුල් ප්‍රයත්නය කෙසේ දකිමුද? අගය කල යුතු හා පුපුරා යන තරමේ ප්‍රතිභාවකින් ගැබ්බර වී සිටින ගාමිණී ඇතුලු නළු කැල, බඩවැල් අඹරවා ගෙන ලෝකයට පමණක් නොව, එකිනෙකාටද සිනහවෙමින් සිටිනා අපට හාස්‍යයම මුල් කොටගත් නිර්මාණම ඉදිරිපත් කිරීම කිනම් අභාග්‍යයක්ද? විශිෂ්ට ගණයේ කුසලතා ඇති නළු නිළි කැලක් ඔබ වටා රොක් වී ඇති මොහොතක එය හරවන් නිර්මාණයක්ම කිරීමට ඔබ නොපෙළඹුණේ ඇයි? අපට ඇති ගැටලුව එයයි. ප්‍රිය ගාමිණී, උත්සාහයක් ලෙස මෙය තෝරා ගන්නත් ඔබ වැන්නන් තෝරා ගතයුතු මග එම මග නොවේ. එය අපට වැටහුණේ නාට්‍ය නරඹා සුට් වේලාවකින්.

මේ කාර්යය සඳහා ඔබ දැරූ වෙහෙස ගැන අපට අවබෝධයක් ඇති නමුදු, නොකියාම බැරි කරුණක් තිබේ. ඒ අප කොතරම් අපටම සිනාසුන ද බෝම්බයක් තවමත් අපට සිනාසීමට කරුණක් වී නැති බවය.

අවසන් වශයෙන් ඔබත් නෙටම් ඇතුට් සෙසු ශිල්පීන්ගේ රංගනයන් උසස් මට්ටමේ තිබූ බව සඳහන් කරන්නට කැමැත්තෙමු. මේ පරිසරය තුළ මෙතරම් ශිල්පීන් රැසක් සමග ඔබ දැරූ ප්‍රයත්නය යළි වඩා හොඳ නිර්මාණයක් සමග ඉදිරියේදී දකින්නට ඇති ප්‍රාර්ථනාවත් සමග සමුගෙන්නෙමු.

සංක්‍රමණිකයා

Ravin
Professional / Patient Instructor
Easy Learning Techniques
Exceptional Pass Rate

අංක එකේ රියැදුරු පුහුණු පාසල

Iyoka
Driving School
Training Excellence

Tel : 94021196
Mobile : 0433028029
iyoka_ds@yahoo.com.au

AAK Electricals

- All Type of Electrical Work
- Split Air Con Installations
- Security Alarms

For friendly and reliable service

Kingsly Perera
Tel/Fax 9457 2307
Mob 0414 412 954

Rec 17466